13

## ගුත්තිල කාව්‍යයේ ගුරුගෝල ගැටුම ගුරුමුෂ්ටිය හා සම්බන්ධ වූවක් ද?

*උදේශිකා දමයන්ති, ඩී. එම්.* [1]

බුදුන්වහන්සේ බුද්ධත්වය පතා පෙරුම් පිරූ ආත්මභවයක් පිළිබඳ ව තොරතුරු කෝට්ටේ යුගයේ දී වෑත්තෑවේ හිමියන් විසින් රචනා කරන ලද ගුත්තිල කාව්‍යයෙහි අන්තර්ගත ය. උදේනි පුරයේ සිට බරණැස් පුරවරයට මූසිලයන් පැමිණෙන්නේ දෙව්ලොව පන්සිළුත් පැරදවිය හැකි අසමාන වාද්‍ය ශක්‍යතාවක් හිමි ගුත්තිල ඇදුරිඳු සොයා ගෙන ය. ඇදුරිඳු ගුරුමුෂ්ටියක් තබා නොගෙන ම ශාස්ත්‍රඥානය ලබා දුන්නේ ය. අහිංසක තරුණයා දරුණු අංගුලිමාලයෙකු වන්නේ දිසාපාමොක් ආචාර්යවරයාගේ වරදිනි. නමුදු ගුත්තිල පඬිතුමා වූ කලි ශිෂ්‍යයන් වරදට යොමු කළ අයෙකු නොවේ. සිඟාලෝවාද සූත්‍රයේ ගුරු-සිසු යුතුකම්හි සඳහන් වන ආකාරයට ගුත්තිල පඬිතුමා තමන් දන්නා සියලු ශිල්පශාස්ත්‍ර ගෝලයාට දුන් අසහාය ගුරුවරයෙකි. ගුත්තිල පඬිවරයා ඛේදවාචකයකට බඳුන්වන්නේ ගුරුමුෂ්ටිය නිසා ද නොඑසේ නම් ගුරු-සිසු යුතුකම්හි අඩුලුහුඬුවක් නිසා ද යන්න සෙවීම පර්යේෂණ ගැටලුවයි. මෙකී ප්‍රස්තුතය පර්යේෂණයට බඳුන් කිරීමේ දී ගුත්තිල කාව්‍යයත් ඒ ආශ්‍රයෙන් ලියවුණු ද්විතීයික හා තෘතීයික මූලාශ්‍රයනුත් ආශ්‍රය කොට ගැනේ. ගුත්තිල පඬිවරයාට සිදු වූයේ කුමක් ද යන්න සෙවීමට ගුත්තිල කාව්‍යයේ ආරම්භයේ සිට අවසානය දක්වා අධ්‍යයනය කිරීම අවශ්‍ය වේ. ගුත්තිල කාව්‍යයේ දී ගුත්තිල පඬිවරයා අසරණ වූයේ ගුරුමුෂ්ටිය තබා නොගෙන ඉගැන්වූ නිසා ය යන්න සනාථ කිරිම මගේ පර්යේෂණයේ අරමුණයි. ගුරු-සිසු යුතුකම් මැනවින් ඉටුවූයේ නම් එදා ආචාර්යවරයා අසරණ වන්නේ නැත. ගුරුවරයා ගුරුමුෂ්ටිය තබා නොගෙන දන්නා සියල්ල ගෝලයාට ලබා දෙන්නේ නම් ගෝලයාගේ යුතුකම ගුරුවරයාට ඉහළින් යාම නොව ගුරු ගෞරවය දැක්වීමයි. අතීතයට මෙන් ම වර්තමානයට ද ගුරු- සිසු යුතුකම් මැනවින් ඉටුවීම අත්‍යවශ්‍ය කරුණකි.

ප්‍රමුඛ පදඃ ගුත්තිල කාව්‍යය, ගුත්තිල පඬිවරයා, මූසිල, ගුරුමුෂ්ටිය, ගුරු- සිසු යුතුකම්,

---

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය*